<u>ඇඹිලිපිටිය නගර සභාව</u>
<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 24 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
----------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළ යුතු ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුලත් සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දෝෂසහගත ගිණුම්කරණය හේතුවෙන් බදු පදනම මත ලබාගත් මෝටර් රථයේ ප්‍රාග්ධන වටිනාකම වූ රු. 6,919,643 ක් අදාල වත්කම් ගිණුම, ණයහිමි ගිණුම, ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමට පිටපත් කරනු වෙනුවට එහි අවිනිශ්චිත පොලියද ඇතුළුව ණය වටිනාකම වූ රු. 7,750,000 ක් එම ගිණුම් වලට පිටපත් කර තිබුණි. තවද, මීට අදාල අවිනිශ්චිත පොලිය සඳහා වූ ලෙජර් ගිණුම්ද ගලපා නොතිබුණි.

(ආ) ආදායම් හා වියදම් වලට අදාල සියළුම ගිණුම් ලෙජරයේ පවත්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 288,333 ක් ණයහිමියන් වෙනුවෙන් වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශ මඟින් ගැලපීම් කර නොතිබුණි.

(ඈ) දේශීය ණය හා සංවර්ධන අරමුදල යටතේ වැසිදිය කාණු පද්ධතිය ඉදිකිරීමට ලබාගෙන ඇති ණය මුදල සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු. 1,047,441 ක ණය වාරික මුදල් සම්බන්ධයෙන් කිසිඳු ගැලපීමක් මූල්‍ය ප්‍රකාශන වල සිදුකර නොතිබුණි.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම අනුව ශේෂ එකතුව රු. 25,060,658 ක්වූ අතර, උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ එකතුව රු. 27,915,796 ක් වූයෙන් වෙනස රු. 3,080,698 ක් විය. එකී වෙනසට හේතු සොයා බලා ලෙජර් ගිණුම් වලට අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | <u>නගර සභා ආඥා පනත (255 අධිකාරය)</u> | |
| | 127(ඉ) වගන්තිය | තම බල ප්‍රදේශය තුල පිහිටි අනතුරුදායක ගස් ඉවත් කිරීමේ බලතල නගර සභාව සතුවූ නමුත්, මෙම කාර්යය සඳහා කම්කරුවන් නොයෙදවීම නිසා එයට අදාලව මහජනතාව විසින් යොමුකරන ලද ඉල්ලීම් ගණනාවක්ම ඉටු කිරීමට නගර සභාව අපොහොසත් වී තිබුණි. |
| (ආ) | <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - 1992</u> | |
| (I) | මුදල් රෙගුලාසි 371(2) | වර්ෂ ගණනාවක සිට ගෙවා තිබු අත්තිකාරම් රු. 1,151,914 ක් පියවා නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි 571 | 1999 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල සීමාවට අදාලව රු. 4,450,990 ක තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.8 ඡේදය | නගර සභාව සතු නිල නිවාසයේ පදිංචි වී සිටින නිළධාරිනිය විසින් විගණිත දිනය වූ 2014 මැයි මස 22 දින දක්වා අවුරුදු 02 මාස 08 ක කාල සීමාවට අදාලව භාවිතා කල විදුලිය හා ජලය වෙනුවෙන් කිසිඳු මුදලක් නගර සභාව වෙත ගෙවීම් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 12,744,440 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 4,165,585 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

වියදම් වැඩිවීමේ වේගයට වඩා වැඩි වේගයකින් ආදායම් වැඩිවීම හේතුවෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුල අතිරික්තය සියයට 206 කින් වැඩි වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 14,732 | 5,220 | 23,465 |
| බදු කුලී | 950 | 1,240 | - |
| බලපත්‍ර ගාස්තු | 350 | 402 | - |
| වෙනත් ආදායම් | 14,900 | 19,535 | 2,792 |

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා රැස්කල ආදායම සැසඳීමේදී වරිපනම් බදු, බලපත්‍ර ගාස්තු හා වරෙන්තු හා දඩ මුදල් වල ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල ආදායමෙහි පිළිවෙලින් සියයට 39, සියයට 105 ක් හා සියයට 59 ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

2.3.3 වරිපනම් බදු

2013 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු. 23,465,000 ක් අයවීමට තිබූ අතර, වර්ෂ ගණනාවක සිට අයවීම ඇනහිට ඇති වරිපනම් ඉහල ප්‍රතිශතයක් ගන්නා අතර, එම වරිපනම් බදු අයකර ගැනීම උදෙසා විශ්‍රාමික නිළධාරියෙකුගේ සහාය ලබාගෙන තිබූ නමුත්, ප්‍රවර්ථන වර්ෂයට අදාල වරිපනම් බදු අයකර ගැනීම සතුටුදායක මට්ටමක නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු මුදලින් සියයට 39 ක හිඟයක් නිරීක්ෂණය විය.

2.3.4 බදු කුලී

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සභාව සතු පල්ලේගම පොදු වෙළඳපොලේ කඩ කාමර 60 ක් බදු දීම හෝ කුළියට ලබා දීම සම්බන්ධයෙන් බදු ගිවිසුමක් හෝ වෙනත් ලිඛිත එකඟතාවයක් ඇතිකර ගෙන නොතිබුණි. නගර මධ්‍යයේ පිහිටි විශාල වටිනාකමකින් යුත් මෙම කඩකාමර මඟින් බදු කුළිය ලෙස සභාවට ලැබිය යුතු ආදායම වර්ෂ ගණනාවක සිට අහිමි වී තිබුණි.

(ආ) පල්ලේගම බස් නැවතුම්පොළ භූමියෙහි පිහිටි තාවකාලික කඩකාමර 30 කට අදාලව රු. 839,316 ක හිඟ මුදලක් විගණිත දින වනවිටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම කඩකාමර විධිමත් ගිවිසුමක් මත බදු දීම සිදුකර නොමැති බවත්, ඒ හේතුවෙන් කඩකාමර කුළී ගෙවීම පැහැර හැර ඇති කඩහිමියන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමේදී නගර සභාවට අහිතකර තත්ත්වයක් උද්ගත වීමේ අවදානමක්ද පැවතුණි.

2.3.5 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට 2010 අගෝස්තු 25 දින නගර සභාව විසින් තීරණය කර තිබුණි. ඒ අනුව ඒ යටතේ නගර සභා බල ප්රදේශය තුල ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් හා බැනර් වෙනුවෙන් සභාව විසින් ගාස්තු අයකල යුතු වුවද, 2014 මැයි මස 27 දින නගර සභාවේ ආදායම් නිළධාරී සමඟ සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නගර සභාව වෙත ගාස්තු ගෙවීමකින් තොරව ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරු ගණනාවක් නිරීක්ෂණය විය.එයට අදාලව සභාවට අහිමි වී ඇති ආදායම දළ වශයෙන් රු. 222,275 ක් විය.

(ආ) නගර සභා බල ප්‍රදේශය තුල විශාල වශයෙන් ත්‍රීරෝද රථගාල් දක්නට ලැබූ නමුත් ඒ සඳහා පහසුකම් සලසා දීමෙන් අනතුරුව අතුරු ව්‍යවස්ථා පනවා මාසික හෝ වාර්ෂික ආදායමක් ලබා ගැනීමේ වැඩ පිළිවෙලක් සභාව සතු නොවීය.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇඹිලිපිටිය දිසා අධිකරණය හා මහේස්ත්‍රාත් අධිකරණය මඟින් 2013 අප්‍රේල් සිට ලැබිය යුතු රු. 1,433,597 ක උසාවි දඩ විගණිත දිනය වනවිටත් හිඟව පැවතුණි.

(ආ) 2012 නොවැම්බර් සිට 2013 මාර්තු දක්වා කාල සීමාවට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 92,800 ක මුදලක් විගණිත දිනය වනවිටද හිඟව පැවති අතර, 2013 මාර්තු මස 31 දිනෙන් පසු ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය හඳුනාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

2.3.7 දුරකථන කුළුණු සඳහා ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 වන දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි V වන උපලේඛණය අනුව සම්මත ගාස්තු අයකල යුතු වුවත්, නගර සභාව විසින් කිසිඳු ගාස්තු අය කිරීමක් සිදු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සභා ආඥා පනතේ 165 ඇ (1) වගන්තියට අනුව සභා සීමාව තුල පිහිටි යම් ඉඩමක් වෙන්දේසි කිරීමේදී එම විකිණීමෙන් ලත් මුදලින් සියයට 1 ක සමාන බද්දක් අදාල වෙන්දේසිකරු විසින් සභාවට ගෙවිය යුතු වුවද සභා බල ප්‍රදේශය තුල පිහිටි ඉඩම් වෙන්දේසි වලදී විකිණීමෙන් ලත් ආදායමෙන්

සියයට 1 ක් වෙනුවට විකිණීමට අපේක්ෂිත ඇස්තමේන්තු විකුණුම් මිලෙන් සියයට 1 ක් බදු වශයෙන් සභාව වෙත ගෙවා තිබුණි. ඒ අනුව නියමිත බදු මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රදේශය තුල පිහිටා ඇති ග්‍රාමීය මාර්ග හඳුනාගෙන ගැසට් නිවේදනයක් මඟින් පවරාගෙන නොතිබුණි. මාර්ග ඉන්වෙන්ට්‍රියක්ද පවත්වා නොතිබුණි.

3.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

----------------------------------

2013 ජුලි 14 දින සිට 18 දින දක්වා තායිලන්තයේදී පවත්වනු ලබන වැඩමුළුවකට සහභාගී වීම සඳහා එක් අයෙකුට රු. 35,000 ක් බැගින් රු. 210,000 ක මුදලක් අත්තිකාරම් ලෙස සමාලෝචිත වර්ෂය තුලදී පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණු අතර අදාල විදේශ සංචාරය ක්‍රියාත්මක වී නොතිබුණි. රු. 210,000 ක්වූ මුදල් ආපසු ලබා ගැනීමට ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සභා ප්‍රතිපාදන යටතේ දකුණු ඇල නවනගරය ප්‍රධාන මාර්ගයේ සිට නවනගරය පාලම දක්වා මාර්ගයේ බෝක්කු ඉදිකිරීම සඳහා රු. 469,932 ක ඇස්තමේන්තුවක් මත ගොවි සංවිධානයක් සමඟ 2013 ජුලි 26 දින රු. 469,931 ක වටිනාකමින් යුත් ගිවිසුමකට එළඹ තිබුණි. 2013 ජුලි 29 දින කොන්ත්‍රාත්කරු වෙත රු. 90,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. විගණිත දිනය වූ 2014 මැයි 22 දින වනවිට ගිවිසුම් ගතවී මාස 07 ක කාලයක් ගතවී ඇතත්, මෙම කර්මාන්තය නිමකර නොතිබුණි. කර්මාන්තයට අදාලව ඉදිකර ඇති අංක 01 හා 02 බෝක්කු වල හියුම් පයිප්ප ජලය බැසයන මට්ටමට පහතින් යෙදීම නිසා ඇලෙහි ජල මට්ටම ඉහලයත්ම ඇලෙහි ගලායන ජලය බෝක්කුව හරහා පෞද්ගලික ඉඩම් වලට ගලාඑන බවත්, එමඟින් මාර්ග ඉදිකිරීම් වල පැවැත්මට හානි වන බවත්, භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) නගර සභා ප්‍රතිපාදන යටතේ නවනගරය දකුණු ඇල සිට නවනගරය පාලම දක්වා මාර්ගය බොරළු යොදා සංවර්ධනය කිරීම අදියර II සඳහා රු. 981,418 ක ඇස්තමේන්තුවක් මත 2013 ජුලි 29 දින රු. 190,000 ක් අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. පරීක්ෂණ දිනය වනවිට ගිවිසුම්ගත වී මාස 07 ක් පමණ ගතවී තිබුණද, විගණිත දිනය වූ 2014 මැයි 22 දින වනවිටත් ඉදිකිරීම් ආරම්භක අවස්ථාවේ පැවතුණි. එසේම මෙම මාර්ගයේ මීටර් 510 ක ප්‍රමාණයක් පමණක් බොරළු යොදා සංවර්ධන කිරීමට ඇස්තමේන්තුගත කර තිබුණද, මාර්ගය සඳහා පස් පුරවා උස් කල යුතු කොටස් වෙනුවෙන් ඇස්තමේන්තු කර නොතිබුණි.

(ඇ) නගර සභා ප්‍රතිපාදන යටතේ දර්ශනගම වැව පාර බොරළු යොදා වැඩිදියුණු කිරීම සඳහා රු. 966,894 ක වටිනාකමින් යුත් ඇස්තමේන්තුවක් මත හිඟුර ආරයාය ගොවි සංවිධානය සමග ගිවිසුමකට 2013 ජනවාරි මස 22 වන දින එළඹ තිබුණි. උක්ත ගිවිසුම් ප්‍රකාරව මෙම කර්මාන්තය සතුටුදායක ලෙස නිමකල බවට වූ කාර්මික නිළධාරීගේ නිර්දේශ අනුව බිල්පත් මත රඳවුම් හා ගිවිසුම් ඇප මුදල් අඩුකිරීමෙන් පසු රු. 773,641 ක මුදලක් 2014 මාර්තු 10 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබුණි. 2014 මැයි මස 27 වන දින සිදුකල විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු අනුව මාර්ගයේ මීටර් 1400 ක දුරක් වැඩිදියුණු කිරීම වෙනුවෙන් රු. 966,642 ක් ගෙවීම් කර තිබුණද, මාර්ගයේ දිග මීටර් 1300 ක් බව අනාවරණය විය. ඒ අනුව මාර්ගයේ මීටර් 100 කට අදාල ඉටුනොකල කාර්යයන් වෙනුවෙන් රු. 69,046 ක් ගෙවීම් කර තිබුණි._තවද, මාර්ගය ආරම්භයේ සිට මීටර් 500 සීමාවේ සිට මීටර් 700 සීමාව (වැවේ සීමාව) දක්වා මීටර් 200 ක ප්‍රමාණයක්ද, මීටර් 800 සීමාවේ සිට මීටර් 1000 සීමාව දක්වා (කෝසුව අසල) තවත් මීටර් 200 ක ප්‍රමාණයක්ද, ලෙස එකතුව මීටර් 400 ක ප්‍රමාණයක විධිමත් පරිදි කාණු කපා

ප්‍රමාණවත් පළලින් යුතුව සංවර්ධනය නොකිරීම හේතුවෙන් යොදන ලද බොරළු සම්පූර්ණයෙන්ම සේදීගොස් මාර්ගය අබලන් වී තිබුණි. ඒ අනුව මීටර් 400 ක කොටස සංවර්ධනය කිරීම වෙනුවෙන් රු. 276,183 ක මුදලක් ගෙවීම සම්බන්ධයෙන් විගණනයට එකඟවිය නොහැක. තත්ත්වය මෙසේ තිබියදීත් කිසිඳු පරීක්ෂා කිරීමකින් තොරව පළාත් ඉංජිනේරුගේ හා කාර්මික නිළධාරීගේ නිර්දේශය මත මෙකී කර්මාන්තයේ රුඳවුම් මුදල්ද නිදහස් කර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 53 කට අදාලව රු. 20,881,448 ක ප්‍රතිපාදන කිසිඳු කාර්යයක නොයොදවා මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 07 කට අදාලව රු. 541,000 ක ප්‍රතිපාදන මුළුමනින්ම වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.

(ඇ) වැය විෂයයන් 17 කට අදාලව ප්‍රතිපාදන මුදලින් සියයට 48 සිට සියයට 96 දක්වා ප්‍රතිශතයකින් වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.

5. පද්ධති හා පාලන
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(ii) අයවැය පාලනය
(iii) ආදායම් පරිපාලනය
(iv) කොන්ත්‍රාත් පාලනය